# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

### අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ "ආශ්‍රිත නිලධාරි" සේවා ගණයේ I, II හා III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025

සේවා ගණ

1. සංවර්ධන සහකාර
2. සැලසුම් හා මූල්‍ය සහකාර
3. කළමනාකරණ සහකාර (උපාධි)

01. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doents.lk වෙබ් අඩවියේ "Our Services" යටතේ ඇති "Online Applications - Recruitment Exams/ E. B. Exams" ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම 2025 දෙසැම්බර් මස 12 දින පෙ. ව. 9.00ට විවෘත වන අතර 2026 ජනවාරි මස 09 වැනි දින රාත්‍රී 9.00ට අවසන් වේ.

අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාල කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අදාළ ආයතන ප්‍රධානියාගේ සහතිකය සමග අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ ඊට පෙර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙම විභාගය 2026 මාර්තු මස කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇතිවන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. (i) මෙම විභාගය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ.

(ii) විභාග අපේක්ෂකත්වය ලැබීම සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුන්ට සිදුවනවා ඇත.

මෙම විභාගය සඳහා අයදුම්කළ හැක්කේ මෙම අමාත්‍යාංශය යටතේ උක්ත සඳහන් සේවා ගණ යටතේ පත්වීම් ලද නිලධාරින්ට තමන් අයත් ශ්‍රේණිය අනුව පහත වගුවේ දක්වා ඇති පරිදි වේ.

| *අනු. අංක* | *විභාගයේ නම* |
|---|---|
| 01. | ආශ්‍රිත නිලධාරි සේවයේ I කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරි සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සඳහා) |
| 02. | ආශ්‍රිත නිලධාරි සේවයේ II කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරි සේවයේ II ශ්‍රේණියේ නිලධාරින් සඳහා) |
| 03. | ආශ්‍රිත නිලධාරි සේවයේ III කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025 (ආශ්‍රිත නිලධාරි සේවයේ I ශ්‍රේණියේ නිලධාරින් සඳහා) |

03. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව සිදු කරන ලද මෘදු පිටපත හා ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන ලද මුද්‍රිත පිටපත (Printout) යන දෙකම විභාග දෙපාර්තමේන්තුවට ලැබුණු පසු එම මෘදු පිටපත හා මුද්‍රිත පිටපත සත්‍යාපනය කිරීම (Verify) සිදුකරනු ලබන අතර වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාරගන්නා ලද බව /භාර නොගන්නා ලද බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් තරයේ පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විභාග ගාස්තු :-

මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ප්‍රථමවරට ඉදිරිපත් වන අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු අය නොකෙරේ. ඉන් පසු වතාවක එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රුපියල් 250/- බැගින් වූ විභාග ගාස්තුවක් අය කෙරේ. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේදය යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions) ;
iii. ලංකා බැංකු ඔන්ලයින් බැංකු ක්‍රමය මගින් (Online Banking Method of Bank of Ceylon);
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon).

*සටහන :-*

(*අ*) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදුකරන ආකාරය පිළිබඳ උපදෙස් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළකර ඇත.

(*ආ*) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවිඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ.

(*ඇ*) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදුකරනු නොලැබේ.

05. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

*a*) ජාතික හැඳුනුම්පත;
*b*) වලංගු විදේශ ගමන් බලපත්‍රය;
*c*) වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ හා වෙනත් සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව තහවුරු කර දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත්කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණු හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපත් වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. එවැනි ප්‍රවේශ පත්‍ර නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මගින්/අයදුම්කරුවන් වෙත කෙටි පණිවිඩයක් මගින් දැනුම් දෙනු ඇත. ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා අයදුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබා ගත් අයදුම්පතේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ ලදුපතේ පිටපත හා අයදුම්පත තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

07. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද විභාග ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

08. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණි. ඒ අතුරින් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවෙන් හෝ විභාගයට පෙනී සිටිය හැකි අතර, පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයකටම පිළිතුරු සැපයිය යුත්තේ එකම මාධ්‍යයෙනි. අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

09. අයදුම්පතේ ද විභාගය සඳහා ප්‍රවේශ පත්‍රයේ ද, අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතු ය. අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු යි. විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශපත්‍රය ඉදිරිපත් කළ යුතු වේ.

10. විභාග පටිපාටිය - එක් එක් කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පෙනී සිටිය හැකි නිලධාරීන් සඳහා වන විෂයයන් සහ විෂය නිර්දේශ පහත සඳහන් පරිදි වේ.

10.1 ආශ්‍රිත නිලධාරි සේවයේ වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(III ශ්‍රේණියේ නිලධාරීන් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණ* |
|---|---|---|---|---|
| 01. කාර්යාල ක්‍රම | 01 | 100 | පැය 2 | 40 |
| 02. ගිණුම් කටයුතු | 01 | 100 | පැය 2 | 40 |

10.1.1 *කාර්යාල ක්‍රම.*- රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳ මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපි ලේඛන මැනවින් අවබෝධ කොටගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස් නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව හා නියෝග අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව පරීක්ෂා කෙරේ.

10.1.2 *ගිණුම් කටයුතු.*- රජයේ කාර්යාලවල භාවිත වන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්ය පිළිබඳ අවබෝධය

10.2 ආශ්‍රිත නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(II ශ්‍රේණියේ නිලධාරින් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. ආයතන කාර්ය පටිපාටිය | 03 | 100 | පැය 2 | 40 |
| 02. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 04 | 100 | පැය 2 | 40 |

10.2.1 *ආයතන කාර්ය පටිපාටිය.*- ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාරය පටිපාටික රීති;

10.2.2 *මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය.*- මුදල් රෙගුලාසි සංග්‍රහය I, II, III, IV, VI පරිච්ඡේද හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

10.3 ආශ්‍රිත නිලධාරි සේවයේ III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2025
(I ශ්‍රේණියේ නිලධාරින් සඳහා)

| *විෂයය* | *විෂයය අංකය* | *ලකුණු* | *කාලය* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01. සාමාන්‍ය දැනීම | 01 | 100 | පැය 2 | 40 |
| 02. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ රෙගුලාසි හා නියමයන් | 01 | 100 | පැය 2 | 40 |

10.3.1 *සාමාන්‍ය දැනීම.*- අධ්‍යාපන සංවර්ධන පිළිබඳ සිදු වී ඇති කාලීන වෙනස්කම් සම්බන්ධයෙන් ලබා ඇති අවබෝධය.

10.3.2 ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ රෙගුලාසි හා නියමයන්, අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති චක්‍රලේඛ, අත්පොත් හා වෙනත් ප්‍රකාශන පිළිබඳ අවබෝධය.

11. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

12. මෙම විභාගය නිවේදනය මගින් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳව වුව ද මෙම අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේ ය.

13. "සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ."

**නාකල කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

**2025 දෙසැම්බර් මස 02 දින,**
**අධ්‍යාපන අමාත්‍යාංශය,**
**"ඉසුරුපාය",**
**බත්තරමුල්ල.**

12 - 169

# Examinations, Results of Examinations & c.

## MINISTRY OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

### "Associated Officer" Service Category Bar Examinations of Efficiency Levels I, II and III for the Officers -2025

*Service Category*

1. Development Officer
2. Planning & Financial Assistant
3. Management Assistant ( Degree holders)

01. APPLICATIONS have been published *via* the link "Online Applications- Recruitment Exams/ E.B. Exams" available under "Our Services" in the website *www.doents.lk* under the Department of Examinations, Sri Lanka and applications can be presented online method only. Acceptance of the applications *via* online is opened from **09.00 am on 12th of December, 2025** and shall be closed at **09.00pm on 09th of January, 2026**. After the application was uploaded online, a printed copy thereof must obtained and should be sent *via* registered post as to be received to the Department of Examinations, Sri Lanka on or before the closing date of the acceptance of the applications together with the authentication by the head of relevant the institution followed by being certified the signature of the applicant after being filled up relevant parts in hand writing. This examination will be held on March of 2026 conducted only in Colombo.

Any kind of disturbance happened due to the lapse in the presentation of Application up to the final date of acceptance of applications, should be borne by the applicant.

02. I. This examination is conducted by the Commissioner General of Examinations of the Department of Examinations, Sri Lanka, and candidates are subject to the rules and regulations directed by him on the conduct of the examination and the release of results.

II. Rules for obtaining candidature for examination are published separately in the *Gazette*. Violation of these rules shall result in a penalty imposed by the Commissioner General of Examinations, Department of Examinations, Sri Lanka.

III. Applications for this examination can be made through the Ministry of Education, Higher Education and Vocational Education as stated in the following table as per the Grade for which the applicant is belonged :

| *Order Number* | *Name of the Examination* |
|---|---|
| 01. | First 1st Efficiency Bar Examination in Associate Officers' Service- 2025 (For the officers in Grade Ill under Associate Officers' Service) |
| 02. | First 2nd Efficiency Bar Examination in Associate Officers' Service- 2025 (For the officers in Grade II under Associate Officers' Service) |
| 03. | First 3rd Efficiency Bar Examination in Associate Officers' Service- 2025 (For the officers in Grade I under Associate Officers' Service) |

03. *Applications :*

The online examination application must be completed in English only. Once the soft copy submitted online by the applicant and the printout sent by registered mail is received by the Examination Department, the soft copy and the printout will be verified and the Department will notify the mobile phone number used to access the system that the application has been accepted/not accepted as a valid application through a short message (SMS) or an e-mail address. Before completing the online application, download the instructions prepared for applying for the examination. Follow the instructions carefully while filling the application. Any amendment made to the application after obtaining a printed copy will not be considered a valid amendment. Incomplete applications will be rejected without notice. Applications received after the last date for receiving applications will not be accepted. The address to which the printed copy should be sent is "Commissioner General of Examinations, Institutional Examinations Branch, Department of Examinations, Sri Lanka, Pelawatte, Battaramulla".

04. *Examination fees:*

No examination fee is charged by the applicants who sit for this examination for the first time. Thereafter, an examination fee of Rs. 250/= is charged per one subject. Payments should be made under the following payment method *via* online provided by the system only when the examination fee is paid.

I. By any Bank Credit Card ;

II. By any Bank Debit Card with the facility of Internet Transaction ;

III. By online Banking Method of Bank of Ceylon ;

IV. By any Branch of the Bank of Ceylon.

*Note*:-

(*a*) Instructions on as to how payment should be made by the method aforementioned have been published in the website under the technical instructions relevant to the Examination. No responsibility is borne by the Department of Examinations in relation to the faults that may be happened when the exam fee is made *via* the above methods.

(*b*) Receipt of payment shall be notified by a short message (SMS) or by an electronic mail (Email). The exact fee of the examination should be paid in full where as the applications which have been paid with lesser or more exam fees of the exact amount shall be rejected.

(*c*) No examination fee shall be refunded or transferred to any other examination under any circumstances.

05. Candidates must prove their identity to the satisfaction of the invigilator for each subject they appear for in the examination hall. Any of the following documents are accepted for this purpose :-

I. National Identity Card ;
II. Valid passport ;
III. Valid Sri Lankan driving license,

Candidates must also enter the examination hall without covering their faces and without wearing electronic communication devices by allowing to be verified their identity. Candidates who refuse to verify their identity shall not be admitted to the examination hall. Furthermore, from the time they enter in to the examination hall until the examination is concluded and they leave, they must remain without covering their faces and hands to let the examination authorities to identify them.

06. Examination admission cards shall be issued to candidates who have submitted duly completed application and paid the prescribed examination fee on or before the last date of receipt of applications, on the premise that only those who meet the qualifications mentioned in the *Gazette* notification have applied. Admission Cards are issued by the Commissioner General of the examinations. Officers sitting for the examination shall present their Admission Cards to the examination hall supervisor with their signatures attested. Candidates will not be allowed to appear for the examination without such admission cards. Admission cards issued to applicants to this effect will be published in the website of the Department of Examinations of Sri Lanka/ a short massage (SMS) will be sent to the Applicant. If the Admission Card has not been received, the applicant should enqueir about it from the Department of Examinations of Sri Lanka as stated in the notice. When enqueiring, the applicant should correctly record the name of the examination for which he has applied, the full name of the applicant, the National Identity Card number and address. If the applicant is a resident outside Colombo, it would be more effective to enquire by sending a request letter stating the applicant's fax number to the fax number mentioned in the notice along with those details. In order to confirm any information sought by the Department of Examinations, it would also be useful to keep ready a copy of the application form, a copy of the relevant receipt for payment of the examination fee, if applicable, and the registered receipt for mailing the application.

07. Admission issued by the Commissioner General of Examinations, Department of Examinations, Sri Lanka Department heads should grant leave of absence to enable officers with papers to appear for the examination. Travel expenses will not be paid.

08. The examination will be conducted in Sinhala and Tamil medium only. Of these, candidates can appear for the examination in the medium of their education or in the official language, and all the question papers appearing must be answered in the same medium. The language medium applied for will not be allowed to be changed later.

09. The applicant's signature must be certified on both the application form and the admit card for the examination. An applicant must get his signature certified by the Head of the Institution or an officer authorized by him. Furthermore, he must present the admitted card with his signature certified to the Examination Hall Supervisor on the first day of appearing for the examination.

10. Examination Procedure - The syllabus for officers who may appear for each Efficiency Bar Examination is as follows :-

10.1 Efficiency Bar Examination I for Associate officer Service-2025 (For Grade III officers)

| *Subject* | *Subject number* | *Marks* | *Time* | *Minimum pass marks* |
|---|---|---|---|---|
| 01 . Office methods | 01 | 100 | 2 hours | 40 |
| 02. Accounting Activities | 02 | 100 | 2 hours | 40 |

10.1.1 Office Systems - Basic knowledge of office systems used in government offices and the ability to apply that knowledge in practice, as well as the ability to understand official documents well, present their opinions and observations in a certain manner through clear and brief notes, and to draft a letter according to the instructions given.

10.1.2 Accounting - Understanding of the functions of basic accounts and financial control books used in government offices.

10.2 Efficiency Bar Examination I I for Associate officer Service-2025
(For Grade II officers)

| *Subject* | *Subject number* | *Marks* | *Time* | *Minimum pass marks* |
|---|---|---|---|---|
| 01. Establishments Procedure | 03 | 100 | 02 hours | 40 |
| 02. Financial Regulations and Public Procurement Procedure | 04 | 100 | 02 hours | 40 |

10.2.1 Establishments Procedure - Chapters of the Establishments code VI, VII, VIII, IX, X, XI, XVI, XXV, XXVI, XXVII, XXVII, XXIX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII and Procedural Rules of the Public Service Commission.

10.2.2 Financial Regulations and Government Procurement Procedure - Chapters I, II, III, IV, V of the Financial Regulations code and the Government Procurement Procedure.

10.3 Efficiency Bar Examination III for Associate officer Service-2025 (For Grade I officers)

| *Subject* | *Subject number* | *Marks* | *Time* | *Minimum pass marks* |
|---|---|---|---|---|
| 01. General Knowledge | 05 | 100 | 02 hours | 40 |
| 02.Regulations and Directions on the General Education in Sri Lanka | 06 | 100 | 02 hours | 40 |

10.3.1 General Knowledge - Understanding of the contemporary changes that have occurred in the development of education.

10.3.2 Regulations and rules on general education in Sri Lanka - Understanding of the circulars, manuals and other publications issued by the Ministry of Education.

11. Issuing an examination admition card to a candidate confirms that he or she has met the eligibility criteria to appear for the examination. It should not e considered an acceptance.

12. The decision of the Secretary to the Ministry of Education shall be final on any matter not provided for in this examination notice.

13. If it appears that there is any discrepancy or inconsistency between the language versions of this announcement published in the Sinhala, Tamil and English media, the Sinhala medium announcement shall be prevailed.

Nalaka Kaluwewa,
Secretary,
Ministry of Education,
Higher Education and Vocational Education.

Ministry of Education, Higher Education and Vocational Education,
"Isurupaya"
Battaramulla,
02nd December, 2025.

12-169